# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014 - පැරණි නිර්දේශය**

**2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල**

**නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍ය හා ප්‍රබන්ධ කථා SINH E - 1015**

**පළමුවන ප්‍රශ්නය ද දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න (02) දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03.00 යි.

---

## I කොටස

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය රසාස්වාදය කරන්න.

මොනවද අම්මේ අකුරු ජාතියක් මල් පෙතිවල කවුදෝ ලිය ලා
කවුරුද අම්මේ මේවා ලියන්නේ පාට පාට ඉරි හැඩ ගහ ලා

පුතා දන්නේ නෑ හඳ ඇති කාලෙට වනන්තරේ හරි වැඩ කෙරෙ තී
බෝසත්වරු බණ කතා කියද්දී වන දෙවඟනො මල්වල ලිය තී

මේ වගෙ ලස්සන පාට අපට නෑ කොතනින් මේවා ගෙන එන් නේ
කොහොමද අම්මේ මේවා කෙරෙන්නේ මට නැහැ මොකවත් තේරෙන්නේ

ඉර පායනකොට ඉර බැස යනකොට පාට වලාකුළු ඇත අහ සේ
ඒ වායින් මේ මල් පැහැගන්වයි ඒවා කෙරෙන්නේ හොර රහ සේ

අම්මේ අම්මේ අර පුංචි කුරුල්ලො කිචිබිචි ගා මොනවද කිය තී
උන් දන්නව ඇති මේ මල් වල ඇති පුංචි අකුරු නිතරම බල තී

ඔව් මගෙ සූකිරි පුංචි පුතේ ඔව් කුරුලු ගීතවල රස මතු වේ
එක එක තාලෙට කියන කියන ගී මල් කොළවල තව තව ලිය වේ

බිම බැලුවත් මල් උඩ බැලුවත් මල් පුංචි කුරුල්ලන් ඉගිලෙන වා
සෑම දාම ඇයි මෙහෙමම නැත්තේ මල් ද කුරුල්ලන් කොහි යන වා

බුදු හාමුදුරුවො ඉපදුන කාලෙට කවදත් ඔහොමයි පුතුනි ම ගේ
මිනිසුන් වාගේම සත්තුන් වාගේම ගහකොළවලටත් සතුට දැ නේ

අම්මේ අර අපි සාදු කියනකොට බුදු හාමුදුරුවො මල් දැක ලා
දුටුවද ටික ටික හිනැහෙන ලස්සන ඉස්සර කිව් බණ මතක් වෙ ලා

## II කොටස

02. ජාතික ව්‍යාපාරය හා තදනුබද්ධ අභිප්‍රායයන් ඉෂ්ට කරගැනීමෙහි ලා කොළඹ යුගයේ වැඩිහිටි කවීන් ස්වකීය පද්‍ය භාවිතයට ගත් ආකාරය සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

03. ස්වභාව සෞන්දර්යය වර්ණනයෙහි ලා කොළඹ යුගයේ තරුණ කවීන් දැක්වූ කුසලතාව කෙබඳු දැයි විභාග කරන්න.

නැතහොත්

පහත සඳහන් කවීන් අතුරින් එක් අයෙකු ගේ කාව්‍ය නිර්මාණ පිළිබඳව ප්‍රමාණවත් ඇගයීමක් කරන්න.

i. එස්. මහින්ද හිමි
ii. පී.බී. සේනානායක
iii. දයාසේන ගුණසිංහ
iv. මොනිකා රුවන් පතිරණ

04. "නාට්‍ය කලාව වනාහි සාමූහික වූ ද සජීව වූ ද දෘශ්‍ය කලා මාධ්‍යයකි." මේ කියමනෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

05. හාස්‍ය හා උපහාස රසෝද්දීපනයෙහි ලා රත්නාවලී නාට්‍ය රචකයා දක්වන කුසලතාව කෙබඳු දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න.

## III කොටස

06. කෙටිකතාව යනු කුමක්දැයි පැහැදිලි කර, එය නවකතාවෙන් වෙනස් වන ආකාරය නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

07. පහත සඳහන් කෙටිකතාවලින් එක් කෙටිකතාවක් විචාරයට ලක් කරන්න.

(නව නිර්දේශය)

i. මුදියන්සේ මාමා
ii. ගුරුවරයා
iii. වතුර
iv. කේතුමතී හෝටලයේ රාත්‍රියක්

(පැරණි නිර්දේශය)

i. අම්මා
ii. අකුරට යන වෙලාවේ
iii. කවියෙකුට අත්දැකීමක්
iv. මාවතේ දරුවෝ

08. "නවකතාවක ජීවය රඳා පවතින්නේ චරිත නිරූපණය මතය." නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

09. නවකතා රචනයෙහි ලා මිණිවන් පී තිලකරත්න සතු කලාත්මක පරිකල්පනය කෙබඳු දැයි තෘෂ්ණාහරණ නවකතාව ඇසුරින් අගයන්න.

★ සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින් ප්‍රදානය කෙරේ.

*********************